රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 3000 ස්ථලය**
**පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/ නොවැම්බර්**

# ACL 31613- ශ්‍රී ලංකාවේ පුරාඅක්ෂර සහ අභිලේඛන

පළමු ප්‍රශ්නය ඇතුලත්ව ප්‍රශ්න හතරකට **(04)** පිළිතුරු සපයන්න.
**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

කාලය : පැය **03**

---

1. සපයා ඇති අභිලේඛන පිටපත්වල ඒ,බී, සී කොටස් තුනෙන්ම එක බැගින් තෝරා අභිලේඛන තුනක (03) පෙල නූතන සිංහල අකුරෙන් ලියා අර්ථය සඳහන් කරන්න. (අදාළ අභිලේඛන පිටපත් අමුණා ඇත.)

   (ඒ).
   i. ලෙන් ලිපි 1 හා 2
   ii. නිගලීසාගර් ටැම් ලිපිය

   (ලකුණු 05 යි)

   (බී).
   i. හැබැස්ස ගිරි ලිපිය
   ii. රුවන්වැලිසෑ පුවරු ලිපිය

   (ලකුණු 05 යි)

   (සී)
   i. මිහින්තලා ටැම් ලිපිය (දී ඇති කොටස)
   ii. මඩවල ගිරි ලිපිය

   (ලකුණු 05 යි)

2. "ලේඛනය ප්‍රභවය වූයේ මිනිස් සමාජය දීර්ඝකාලීනව ලැබූ අත්දැකීම් සමුදායක ප්‍රතිඵලයක් ලෙසිනි." සාකච්ඡා කරන්න.

   (ලකුණු 15 යි)

3. පුරාණ ඉන්දීය බ්‍රාහ්මීය අක්ෂර මාලාවේ ආරම්භය විකාශය හා ඒ පිළිබඳ සිදුකල පර්යේෂණ විමසුමට ලක් කරන්න.

   (ලකුණු 15 යි)

4. ක්‍රි.පූ. තුන්වන (03) සියවස හා ක්‍රි.ව. පළමු (01) සියවස අතර ලාංකේය සමාජය පිළිබඳ සමකාලීන ශිලා ලේඛන වලින් හෙළිවන කරුණු උදාහරණ සහිතව විස්තර කරන්න.

   (ලකුණු 15 යි)



99

5. ක්‍රි.ව. පළමු (01) සියවසේ සිට ක්‍රි.ව හතරවන (04) සියවස තෙක් ලංකාවේ ලියවුනු අභිලේඛනවල නව ප්‍රවනතා සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි)

6. පළමුවන මේඝවර්ණාභය රජුගේ තෝනිගල ශිලා ලිපියෙන් හෙළිවන සමකාලීන සමාජ තොරතුරු විමර්ශනය කරන්න.

(ලකුණු 15 යි)

7. මෙහි දක්වා ඇති ශිලා ලේඛන ඇසුරින් සපයා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ගැරඬිගල ශිලා ලේඛනය)

(ලකුණු 15 යි)



(7.i). මෙම ලිපියේ කර්තෘත්වය පිළිබඳ පවත්නා මතවාද

(ලකුණු 05 යි)

(7.ii).මෙම ලිපියේ අන්තර් ගතයේ සුවිශේෂතා

(ලකුණු 05 යි)

(7.iii). මෙම ලිපියේ අක්ෂරමාලාවේ ඇති පරිණාමීය ලක්ෂණ

(ලකුණු 05 යි)

8. අනුරාධපුර යුගයේ අවසන් සමයෙහි ලංකාවේ ක්‍රියාත්මක වූ නීතිය හා දඬුවම් ක්‍රම පිළිබඳ අභිලේඛනමය සාක්ෂි ගෙනහැර දක්වන්න.

(ලකුණු 15 යි)

@@@@@@@@@@@@@@



91

## අංක 01 ප්‍රශ්නයට අදාළ අභිලේඛන පිටපත්

**(ඒ) .i**

ලෙන් ලිපිය-1



ලෙන් ලිපිය-2



**(ඒ) .ii නීගලීසාගර් ටැම් ලිපිය**



(බී) .i හැබැස්ස ගිරි ලිපිය



(බී) .ii රුවන්වැලිසෑ පුවරු ලිපිය



(සී) .i මිහින්තලා ටැම් ලිපිය



(සී) .ii මඩවල ගිරි ලිපිය

